
# සතිපතා ආර්ථික දර්ශක

2022 ජුනි 17



සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

2022 මැයි මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පිළිවෙළින් 50.3ක හා 42.4ක දර්ශක අගයන් වාර්තා කරමින් පෙර මාසයට සාපේක්ෂව පසුබෑමක් පෙන්නුම් කරන ලදී.

සලකා බලන කාලපරිච්ඡේදය (2022.06.11 සිට 2022.06.17 දක්වා කාලය) තුළ දී බොරතෙල් මිල ගණන් මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය. ඔපෙක් සංවිධානය මගින් ප්‍රකාශයට පත්කළ නිෂ්පාදන දත්තවල පහත වැටීම හේතුවෙන් කාලපරිච්ඡේදය ආරම්භයේ දී බොරතෙල් මිල ඉහළ ගියේය. කෙසේ වෙතත්, ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාත කැපී පෙනෙන ලෙස ඉහළ දැමීමෙන් පසුව ඉල්ලුම පහළ යෑම පිළිබඳ වූ අවිනිශ්චිතතා සමග බොරතෙල් මිල පහත වැටුණි. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල ගණන් පිළිවෙළින් එක්සත් ජනපද ඩොලර් 0.73කින් සහ එක්සත් ජනපද ඩොලර් 1.70කින් පහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2022 ජූනි මස 17 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 33කින් සියයට 21.27ක් දක්වා පහළ ගියේය.

2022 අප්‍රේල් මාසයේ දී පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය සියයට 20.0ක් විය*.
2022 අප්‍රේල් මාසයේ දී බැංකු පද්ධතිය මගින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 4.6කින් ඉහළ ගියේය*.
රාජ්‍ය සංස්ථා වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2022 අප්‍රේල් මාසයේ දී රුපියල් බිලියන 177.2කින් ඉහළ ගියේය*.
පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ප්‍රමාණය 2022 අප්‍රේල් මාසයේ දී රුපියල් බිලියන 219.3කින් ඉහළ ගියේය*.
*2022 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම, 2022 මාර්තු හා අප්‍රේල් මාසවල මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ යන ලදී.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 680.836ක හිඟයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 629.002ක හිඟයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2022 ජූනි 17 වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 5.40කින් දර්ශක අගය 7,472.39ක් දක්වා පහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා දර්ශකය සියයට 7.50කින් දර්ශක අගය 2,368.65ක් දක්වා පහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසන් වන මාස දෙක තුළ දී, රාජ්‍ය ආදායම 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 238.3ට සාපේක්ෂව රු. බිලියන 311.5ක් දක්වා ඉහළ ගියේය.

2022 වසරේ ජනවාරි සිට පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, සමස්ත වියදම සහ ශුද්ධ ණය දීම් 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 466.0ට සාපේක්ෂව රු. බිලියන 551.7ක් දක්වා වැඩි විය.

2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසන් වන මාස දෙක තුළ දී, සමස්ත අයවැය හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 227.7ට සාපේක්ෂව රු. බිලියන 240.2ක් දක්වා වැඩි විය.

දේශීය මූල්‍යනය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පැවති රු. බිලියන 274.5ට සාපේක්ෂව, 2022 වසරේ පෙබරවාරි මාසයෙන් අවසන් වන මාස දෙක තුළ දී, රු. බිලියන 368.8ක් දක්වා ඉහළ ගියේය. විදේශීය මූල්‍යනය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 46.8ක ශුද්ධ ණය ආපසු ගෙවීමට සාපේක්ෂව, 2022 වසරේ ජනවාරි සිට පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදය තුළ දී, රු. බිලියන 128.6ක ශුද්ධ ණය ආපසු ගෙවීමක් ලෙස වාර්තා විය.

මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය 2021 වසර අවසානයේ දී පැවති රු. බිලියන 17,589.4ක සිට 2022 වසරේ පෙබරවාරි මාසය අවසානය වන විට රු. බිලියන 17,940.2ක් දක්වා වැඩි විය. 2022 වසරේ පෙබරවාරි මාසය අවසානය වන විට සමස්ත නොපියවූ දේශීය ණය ප්‍රමාණය රු. බිලියන 11,479.0ක් වූ අතර සමස්ත නොපියවූ විදේශීය ණය ප්‍රමාණයේ රුපියල් අගය රු. බිලියන 6,461.2ක් විය.

## විදේශීය අංශය

2022 වසරේ ජූනි 17 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 44.3කින් අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකවල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 41.6කින්, යූරෝවලට සාපේක්ෂව සියයට 40.1කින්, ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 39.0කින් සහ ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 35.4කින් අවප්‍රමාණය විය.

2022 වසරේ පළමු මාස හතර තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 4,219ක් දක්වා සියයට 11.0කින් ඉහළ ගිය අතර, මේ සඳහා රෙදිපිළි හා ඇඟලුම් (13.2%), ඛනිජතෙල් නිෂ්පාදිත (94.9%), මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ (25.4%), මූල ලෝහ හා උපාංග (51.0%) සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ (11.8%) අපනයන ආදායම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2022 වසරේ පළමු මාස හතර තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 7,350ක් දක්වා සියයට 8.9කින් ඉහළ ගිය අතර, ඉන්ධන (38.3%), රෙදිපිළි හා රෙදිපිළි උපාංග (23.8%), ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (1,210.6%) සහ ගොඩනැගිලි ද්‍රව්‍ය (9.3%) ආනයන ඉහළ යෑම මේ සඳහා විශාල වශයෙන් හේතු විය. ඒ අනුව, 2022 වසරේ පළමු මාස හතර තුළ දී වෙළඳ හිඟය, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 2,948 සිට එක්සත් ජනපද ඩොලර් මිලියන 3,131ක් දක්වා පුළුල් විය.

ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 11.6කින් ඉහළ ගියේය. 2022 වසරේ අප්‍රේල් මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 24.4කින් ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ ආනයන මිල ගණන් ඉහළ යෑම හේතු විය. මේ අනුව, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 77.6ක් දක්වා සියයට 10.3කින් පහළ ගියේය.

තේ සඳහා වෙන්දේසි මිලෙහි සාමාන්‍යය (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2021 වසරේ අප්‍රේල් මාසයේ පැවති කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 3.19ක සිට 2022 වසරේ අප්‍රේල් මාසයේ දී කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 4.25ක් දක්වා ඉහළ ගියේය.


# මූර්ත අංශය


## 1.1 මිල දර්ශක

| ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | අප්‍රේල් 2022 | මසකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - (ජා.පා.මි.ද.) | 190.3 | 172.7 | 142.2 |
| මාසික ප්‍රතිශත වෙනස % | 10.2 | 2.9 | 0.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 13.0 | 10.6 | 5.3 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 33.8 | 21.5 | 5.5 |
| මූලික උද්ධමනය - (ජා.පා.මි.ද.) | 182.3 | 166.3 | 142.5 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 10.2 | 8.2 | 4.4 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 27.9 | 17.3 | 4.1 |

| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) | මැයි 2022 | මසකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - (කො.පා.මි.ද.) | 195.2 | 180.2 | 140.3 |
| මාසික ප්‍රතිශත වෙනස % | 8.3 | 9.3 | 1.1 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 14.2 | 11.3 | 3.9 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 39.1 | 29.8 | 4.5 |
| මූලික උද්ධමනය- (කො.පා.මි.ද.) | 182.9 | 172.4 | 142.5 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | 10.2 | 8.1 | 3.0 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 28.4 | 22.0 | 3.2 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව




## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ


| ආහාර අයිතමය | තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | | කිලෝ ග්‍රෑමයට රුපියල් | | | |
| **සහල්** | | | | | | | | |
| සම්බා | 240.00 | 233.00 | 220.00 | 140.00 | ලැනො. | 248.00 | 230.00 | 145.00 |
| රතු කැකුළු | 259.00 | 232.00 | 206.04 | 98.23 | 275.00 | 246.00 | 213.75 | 105.00 |
| **එළවළු** | | | | | | | | |
| බෝංචි | 675.00 | 610.00 | 450.00 | 180.00 | 725.00 | 660.00 | 500.00 | 235.00 |
| ගෝවා | 305.00 | 252.00 | 135.00 | 120.00 | 357.50 | 310.00 | 180.00 | 160.00 |
| කැරට් | 295.00 | 274.00 | 237.50 | 120.00 | 345.00 | 316.00 | 287.50 | 150.00 |
| තක්කාලි | 562.50 | 680.00 | 662.50 | 110.00 | 612.50 | 736.00 | 712.50 | 150.00 |
| වට්ටක්කා | 157.50 | 106.00 | 90.00 | 40.00 | 177.50 | 126.00 | 110.00 | 60.00 |
| පතෝල | 300.00 | 340.00 | 237.50 | 130.00 | 350.00 | 374.00 | 287.50 | 175.00 |
| වම්බටු | 295.00 | 296.00 | 275.00 | 115.00 | 350.00 | 346.00 | 325.00 | 155.00 |
| **අනෙකුත් ආහාර** | | | | | | | | |
| රතු ළූණු (දේශීය) | 412.50 | 400.00 | 325.00 | 264.40 | ලැනො. | ලැනො. | 325.00 | 280.00 |
| ලොකු ළූණු (ආනයනික) | 189.88 | 171.67 | 161.02 | 79.16 | 212.50 | 191.00 | 177.50 | 95.00 |
| අර්තාපල් (දේශීය) | 305.88 | 290.73 | 276.50 | 139.13 | 360.00 | 299.93 | 276.50 | 160.00 |
| වියළි මිරිස් (ආනයනික) | 1,854.00 | 1,790.00 | 1,508.75 | 469.77 | 1,950.00 | 1,850.00 | 1,650.00 | 530.00 |
| පරිප්පු | 616.13 | 617.90 | 553.75 | 191.20 | 630.00 | 630.00 | 573.75 | 210.00 |
| බිත්තර-සුදු (එකක මිල) | 40.75 | 41.00 | 30.50 | 15.50 | 41.50 | 41.50 | 31.00 | 16.50 |
| පොල් (ගෙඩියක මිල) | 78.50 | 79.00 | 80.00 | 80.00 | 80.00 | 80.00 | 80.00 | 92.50 |
| අමු මිරිස් | 587.50 | 555.00 | 250.00 | 212.50 | 637.50 | 608.00 | 300.00 | 275.00 |
| දෙහි | 412.50 | 400.00 | 562.50 | 120.00 | 481.25 | 475.00 | 625.00 | 150.00 |


### 1.2.2 පෑලියගොඩ සහ මීගමුව මාළු වෙළඳපොළ


| ආහාර අයිතමය | පෑලියගොඩ | | මීගමුව | | | |
|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය |
| කෙලවල්ලා | 1,512.50 | 1,700.00 | 1,327.50 | 1,324.00 | 1,790.00 | 1,790.00 |
| බලයා | 937.50 | 1,070.00 | 883.33 | 1,000.00 | 1,003.33 | 1,120.00 |
| සාලයා | 720.00 | 770.00 | 702.50 | 686.00 | 815.00 | 790.00 |
| හුරුල්ලා | 1,037.50 | 1,100.00 | 950.00 | 950.00 | 1,050.00 | 1,080.00 |


ලැනො. - ලැබී නොමැත.


## නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල





### 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| **සහල්** | | |
| සම්බා | 230.00 | 230.00 |
| රතු කැකුළු | ලැනො. | ලැනො. |
| **එළවළු** | | |
| බෝංචි | 531.67 | 479.00 |
| ගෝවා | 251.67 | 266.00 |
| කැරට් | 290.00 | 231.00 |
| තක්කාලි | 421.67 | 569.00 |
| වට්ටක්කා | 161.67 | 129.50 |
| පතෝල | 220.00 | 264.00 |
| වම්බටු | 278.33 | 256.50 |
| අළු කෙසෙල් | 73.33 | 72.50 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 375.00 | 298.75 |
| ලොකු ළූණු (ආනයනික) | 166.67 | 174.50 |
| අර්තාපල් (දේශීය) | 283.75 | 263.50 |
| වියළි මිරිස් (ආනයනික) | 1,766.67 | 1,670.00 |
| පොල් (ගෙඩියක මිල) | 63.00 | 60.60 |

### 1.2.5 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය | | | | |
|---|---|---|---|---|
| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | මෙම සතිය | පසුගිය සතිය | පසුගිය මාසය | පසුගිය වසර |
| සම්බා | 266.38 | 248.50 | 213.00 | 146.75 |
| සුදු කැකුළු | 246.38 | 222.60 | 200.25 | 110.00 |
| රතු කැකුළු | 256.38 | 226.00 | 204.38 | 99.00 |
| නාඩු | 258.75 | 242.00 | 207.50 | 116.25 |

### 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| **සහල්** | | |
| සම්බා | 230.00 | 230.00 |
| රතු කැකුළු | 210.00 | 228.00 |
| **එළවළු** | | |
| බෝංචි | 835.00 | 820.00 |
| ගෝවා | 400.00 | 336.00 |
| කැරට් | 373.33 | 384.00 |
| තක්කාලි | 733.33 | 860.00 |
| වට්ටක්කා | 226.67 | 180.00 |
| පතෝල | 453.33 | 416.00 |
| වම්බටු | 400.00 | 408.00 |
| **අනෙකුත් ආහාර** | | |
| රතු ළූණු (දේශීය) | 480.00 | 515.00 |
| ලොකු ළූණු (ආනයනික) | 213.33 | 212.00 |
| අර්තාපල් (දේශීය) | 400.00 | 392.00 |
| අර්තාපල් (ආනයනික) | 240.00 | 228.00 |
| වියළි මිරිස් (ආනයනික) | 1,886.67 | 1,840.00 |
| පරිප්පු | 633.33 | 640.00 |
| සුදු සීනි | 316.67 | 315.00 |
| බිත්තර-සුදු (එකක මිල) | 42.00 | 42.00 |
| පොල් (ගෙඩියක මිල) | 100.00 | 100.00 |
| අමු මිරිස් | 766.67 | 680.00 |
| **මාළු** | | |
| කෙලවල්ලා | 2,000.00 | 2,228.00 |
| බලයා | 1,080.00 | 1,198.00 |
| සාලයා | 653.33 | 862.00 |
| හුරුල්ලා | 1,180.00 | 1,305.00 |

ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2010 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | 2020 වාර්ෂික (අ)(ආ) | 2021 වාර්ෂික (අ) | 2020 සිව්වන කාර්තුව (අ)(ආ) | 2021 සිව්වන කාර්තුව (අ) |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික | (2.2) | 2.0 | 2.0 | (4.9) |
| කාර්මික | (6.9) | 5.3 | 1.5 | (0.2) |
| සේවා | (1.6) | 3.0 | 1.7 | 3.8 |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | (8.1) | 4.9 | (0.9) | 0.1 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **(3.6)** | **3.7** | **1.3** | **1.8** |

(අ) තාවකාලික (ආ) සංශෝධිත





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ඒකකය | 2021 ජන-අප්‍රේල් (අ) | 2022 ජන-අප්‍රේල් (ආ) | % වෙනස |
|---|---|---|---|---|
| තේ | (කි.ග්‍රෑ. මිලියන) | 104.5 | 85.9 | (17.8) |
| රබර් | (කි.ග්‍රෑ. මිලියන) | 29.8 | 25.6 | (14.3) |
| පොල් | (ගෙඩි මිලියන) | 953.5 | 1,122.5 | 17.7 |

(අ) සංශෝධිත (ආ) තාවකාලික





## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | අප්‍රේල් 2021 (ආ) | අප්‍රේල් 2022 (ඇ) | % වෙනස |
|---|---|---|---|
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | **94.1** | **87.3** | **(7.2)** |
| ආහාර නිෂ්පාදන | 103.3 | 90.5 | (12.4) |
| ඇඟලුම් නිෂ්පාදන | 73.4 | 97.0 | 32.2 |
| අනෙකුත් ලෝහ නොවන ඛණිජ නිෂ්පාදන | 125.2 | 124.1 | (0.8) |
| පිරිපහදුකළ ඛණිජතෙල් නිෂ්පාදන | 68.0 | 1.5 | (97.8) |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 85.5 | 86.2 | 0.8 |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 88.7 | 118.2 | 33.3 |
| පාන වර්ග | 126.1 | 126.4 | 0.2 |

(අ) ප්‍රධාන උප අංශ 7


(ආ) සංශෝධිත (ඇ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

| මාසය/වසර | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | | | | ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අප්‍රේල් 2021 | මැයි 2021 | අප්‍රේල් 2022 | මැයි 2022 | අප්‍රේල් 2021 | මැයි 2021 | අප්‍රේල් 2022 | මැයි 2022 |
| දර්ශකය | 44.3 | 42.1 | 36.4 | 50.3 | 48.9 | 39.5 | 43.8 | 42.4 |





## 1.7 වැටුප් සහ සේවා නියුක්තිය

### 1.7.1 වැටුප් ප්‍රමාණ දර්ශක

| අයිතමය | 2021 අප්‍රේල් | 2022 අප්‍රේල් | % වෙනස |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන් (2016 = 100) - නාමික | 114.6 | 133.1 | 16.1 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2012 = 100) - නාමික | 194.7 | 244.8 | 25.8 |
| කෘෂිකර්මාන්ත | 200.1 | 247.8 | 23.9 |
| කර්මාන්ත | 196.2 | 246.8 | 25.8 |
| සේවා | 190.9 | 241.5 | 26.5 |




## 1.7.2 සේවා නියුක්තිය (අ)

| අයිතමය | 2020 සිව්වන කාර්තුව | 2021 සිව්වන කාර්තුව (ආ) | 2020 වාර්ෂික |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 50.1 | 49.5 | 50.6 |
| සේවා වියුක්ති අනුපාතිකය | 5.2 | 4.6 | 5.5 |
| **අයිතමය** | **2020 සිව්වන කාර්තුව** | **2021 සිව්වන කාර්තුව (ආ)** | **2020 වාර්ෂික** |
| **අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන් (ඇ) (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)** | | | |
| කෘෂිකර්මාන්ත | 29.0 | 26.1 | 27.1 |
| කර්මාන්ත | 26.2 | 27.0 | 26.9 |
| සේවා | 44.8 | 46.9 | 46.0 |

(අ) වැඩ කරන වයසේ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි

(ආ) තාවකාලික

(ඇ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


## 1.8 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2021 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|
| | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) | ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) | | ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්)(අ) |
| | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | | බ්‍රෙන්ට් (පාදක මිල) | ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | |
| ජනවාරි | 54.85 | 51.65 | 57.65 | 84.96 | 82.55 | 84.09 |
| පෙබරවාරි | 61.82 | 58.63 | 64.07 | 94.17 | 91.74 | 76.41 |
| මාර්තු | 65.89 | 62.60 | - | 114.05 | 109.66 | - |
| අප්‍රේල් | 65.22 | 61.61 | 66.44 | 105.56 | 101.23 | - |
| මැයි | 68.24 | 65.13 | 68.47 | 111.91 | 109.64 | 109.94 |
| ජූනි | 73.11 | 71.01 | - | | | |
| ජූලි | 74.41 | 72.79 | 68.92 | | | |
| අගෝස්තු | 70.45 | 67.76 | 74.88 | | | |
| සැප්තැම්බර් | 74.70 | 71.21 | - | | | |
| ඔක්තෝබර් | 83.35 | 80.66 | 73.51 | | | |
| නොවැම්බර් | 81.67 | 79.54 | - | | | |
| දෙසැම්බර් | 74.63 | 71.55 | 85.38 | | | |
| **දිනය** | **2021** | | | **2022** | | |
| ජූනි 11 | 72.29 | 70.07 | | - | - | |
| ජූනි 12 | - | - | | - | - | |
| ජූනි 13 | - | - | | 119.69 | 118.36 | |
| ජූනි 14 | 72.99 | 71.20 | | - | - | |
| ජූනි 15 | 73.14 | 71.16 | | 121.68 | 119.41 | |
| ජූනි 16 | 74.62 | 72.71 | | 119.77 | 116.66 | |
| ජූනි 17 | 73.68 | 71.48 | | 118.96 | 116.66 | |

මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං .ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ ඍජුව සැසඳිය නොහැකිය . එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2021 වසරේ මාර්තු, ජූනි, සැප්තැම්බර්, නොවැම්බර් සහ 2022 වසරේ මාර්තු සහ අප්‍රේල් යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත .



# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| අයිතමය | 2022 ජූනි 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| **ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 13.50 | 13.50 | 4.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 14.50 | 14.50 | 5.50 |
| බැංකු අනුපාතිකය | 17.50 | 17.50 | 8.50 |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 14.50 | 14.50 | 4.82 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික** | | | |
| දින 91 | 20.73 | 21.91 | 5.17 |
| දින 182 | 21.90 | 22.89 | 5.17 |
| දින 364 | 22.04 | 23.13 | 5.21 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 21.27 | 21.60 | 5.74 |
| | 2022 අප්‍රේල් | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.10-6.10 | 0.10-6.35 | 0.10-7.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 0.25-20.00 | 0.25-15.00 | 0.25-15.00 |
| | 2022 මැයි | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 6.99 | 5.52 | 4.97 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 8.97 | 6.84 | 5.94 |
| | 2022 අප්‍රේල් | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 15.35 | 7.68 | 4.77 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 15.63 | 8.06 | 4.92 |
| | 2022 අප්‍රේල් | මසකට පෙර | වසරකට පෙර |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 11.31 | 10.35 | 9.73 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 13.72 | 10.73 | 7.95 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | | |
| | 2022 අප්‍රේල් | මසකට පෙර | වසරකට පෙර |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.50 | 3.50 | 3.50 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 14.50 | 7.50 | 5.00 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 03<br>2022 ජූනි 10 | වසර 05 මාස 07<br>2022 ජූනි 10 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 17.00 | 18.00 |
| බර තබන ලද සාමාන්‍ය එලදා අනුපාතිකය | 20.30 | 20.19 |

| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2022 ජූනි 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර |
|---|---|---|
| ලංකා බැංකුව | 21.63 | 22.24 |
| මහජන බැංකුව [ඇ] | 22.12 | 22.12 |
| හැටන් නැෂනල් බැංකුව | 24.15 | 24.18 |
| කොමර්ෂල් බැංකුව | 23.28 | 22.96 |
| සම්පත් බැංකුව | 22.10 | 23.46 |
| සෙලාන් බැංකුව | 21.24 | 20.29 |
| යූනියන් බැංකුව | 25.14 | 24.74 |
| පෑන් ඒෂියා බැංකුව | 24.00 | 24.00 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 23.30 | 22.12 |
| ඩීඑෆ්සීසී බැංකුව | 23.12 | 24.81 |
| එන්ඩීබී බැංකුව [ඇ] | 25.00 | 25.00 |
| අමානා බැංකුව [ඇ] | 20.36 | 20.36 |

| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව | 2022 ජූනි 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර |
|---|---|---|
| කාර්ගිල්ස් බැංකුව | 30.00 | 30.00 |
| එච්එස්බීසී බැංකුව | 22.72 | 23.87 |
| ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 22.82 | 22.11 |
| සිටි බැංකුව | 21.33 | 20.00 |
| ඩොයිෂ් බැංකුව | 17.00 | 16.46 |
| හබීබ් බැංකුව [ඇ] | 21.42 | 21.42 |
| ඉන්දියන් බැංකුව | 22.62 | 22.24 |
| ඉන්දියන් ඕවර්සීස් බැංකුව [ඇ] | 6.82 | 6.82 |
| එම්සීබී බැංකුව | 22.40 | 20.99 |
| ඉන්දීය රාජ්‍ය බැංකුව | 18.28 | 20.07 |
| පබ්ලික් බැංකුව [ඇ] | 22.12 | 22.12 |

(ඇ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත . එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත .

## 2.2 මුදල් සැපයුම

| අයිතමය | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | 2022 අප්‍රේල් (අ)(ආ) | මසකට පෙර (ආ) (ඇ) | වසරකට පෙර (ඈ) | 2022 අප්‍රේල් (අ)(ආ) | මසකට පෙර (ආ) (ඇ) | වසරකට පෙර (ඈ) |
| සංචිත මුදල් | 1,481.8 | 1,386.7 | 1,031.1 | 43.7 | 34.8 | 0.9 |
| පටු මුදල් සැපයුම ($M_1$) | 1,635.1 | 1,589.6 | 1,244.2 | 31.4 | 28.9 | 25.4 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | 10,193.4 | 10,073.4 | 8,944.6 | 14.0 | 13.7 | 19.8 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 11,940.6 | 11,575.6 | 9,947.3 | 20.0 | 17.7 | 20.4 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් (ඉ) | (2,195.2) | (1,888.7) | (430.7) | (409.7) | (339.3) | (615.8) |
| මුදල් අධිකාරීන් | (1,462.2) | (1,203.4) | 342.9 | (526.4) | (452.9) | (63.9) |
| වාණිජ බැංකු | (732.9) | (685.3) | (773.6) | 5.3 | 11.1 | 10.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | (703.0) | (607.2) | (489.8) | (43.5) | (22.3) | (21.6) |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | (29.9) | (78.1) | (283.9) | 89.5 | 71.6 | 38.7 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම් (ඉ) | 14,135.8 | 13,464.3 | 10,378.0 | 36.2 | 31.1 | 26.9 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 6,548.1 | 6,543.5 | 4,965.1 | 31.9 | 32.4 | 50.4 |
| මහ බැංකුව | 2,889.4 | 2,682.5 | 1,070.5 | 169.9 | 145.6 | 89.2 |
| වාණිජ බැංකු | 3,658.7 | 3,861.0 | 3,894.5 | (6.1) | 0.3 | 42.4 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 3,161.1 | 3,419.2 | 3,454.5 | (8.5) | 0.2 | 55.5 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 497.6 | 441.8 | 440.0 | 13.1 | 0.7 | (14.3) |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 1,725.0 | 1,547.8 | 1,093.4 | 57.8 | 40.9 | 17.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,456.5 | 1,307.5 | 648.9 | 124.4 | 107.0 | 24.6 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 268.5 | 240.3 | 444.4 | (39.6) | (48.5) | 7.6 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,752.5 | 7,533.2 | 6,445.9 | 20.3 | 17.9 | 8.2 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,955.0 | 6,839.2 | 5,981.9 | 16.3 | 15.4 | 9.0 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 797.5 | 694.0 | 464.0 | 71.9 | 50.2 | (0.3) |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | (1,889.8) | (2,160.3) | (2,126.3) | 11.1 | (0.0) | (5.5) |


(අ) තාවකාලික


(ආ) 2022 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකා රුපියල සැලකියයුතු ලෙස අවප්‍රමාණය වීම 2022 මාර්තු හා අප්‍රේල් මාසවල මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත .


(ඇ) සංශෝධිත

(ඈ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වාර්තා කරන ලද ඇතැම් දත්ත නිවැරදිව වර්ගීකරණය නොකිරීම හේතුවෙන් , 2021 මාර්තු සිට 2022 ජනවාරි දක්වා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් විසින් රජය වෙත ලබා දුන් ණය පිළිබඳ දත්ත සංශෝධනය කරන ලදී .

(ඉ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) අදාළව





## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| අයිතමය | 2022 ජූනි 09 | 2022 ජූනි 16 | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,454,839.72 | 1,465,912.19 | 11,072.48 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| අයිතමය | 2022 ජූනි 13 | 2022 ජූනි 15 | 2022 ජූනි 16 | 2022 ජූනි 17 |
|---|---|---|---|---|
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 14.50 | 14.50 | 14.50 | 14.50 |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 7,000 | 1,250 | 3,000 | 3,500 |
| **වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම්** | | | | |
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 14.50 | 14.50 | 14.50 | - |
| දළ වටිනාකම (රුපියල් මිලියන) | 3,350 | 2,150 | 550 | - |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| අයිතමය | 2022 ජූනි 13 | 2022 ජූනි 15 | 2022 ජූනි 16 | 2022 ජූනි 17 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් මිලියන) | 1,969,823.74 | 1,997,699.01 | 1,997,699.01 | 2,045,937.85 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් මිලියන) | 1,868,558.00 | 1,898,678.90 | 1,900,593.22 | 1,944,920.59 |

**2.6 විවට වෙළඳ කටයුතු**

| අයිතමය | 2022 ජූනි 13 | 2022 ජූනි 15 | 2022 ජූනි 16 | | | | 2022 ජූනි 17 |
|---|---|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | 5.00 | 10.00 | 5.00 | 5.00 | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | | | |
| පියවීමේ දිනය | | | 2022 ජූනි 17 | 2022 ජූනි 17 | 2022 ජූනි 17 | 2022 ජූනි 17 | |
| පරිණත වන දිනය | | | 2022 දෙසැම්බර් 23 | 2023 ජනවාරි 6 | 2023 පෙබරවාරි 24 | 2023 මාර්තු 3 | |
| කාල සීමාව (දින ගණන) | | | 189 | 203 | 252 | 259 | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | 2.50 | 1.31 | 0.50 | 1.00 | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | - | 0.50 | - | - | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | - | 21.80 | - | - | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | - | 22.00 | - | - | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | - | 21.90 | - | - | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| පියවීමේ දිනය | | | | | | | |
| පරිණත වන දිනය | | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| පියවීමේ දිනය | | | | | | | |
| පරිණත වන දිනය | | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 200.682 | 205.241 | 204.871 | | | | 195.370 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 749.415 | 771.819 | 746.836 | | | | 694.872 |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | (548.733) | (566.578) | (541.965) | | | | (499.502) |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)**** | (678.233) | (696.078) | (671.465) | | | | (629.002) |

**සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම් /ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් (අ)

| අයිතමය | 2021<br>දෙසැ. අවසානයට | 2022<br>මාර්තු අවසානයට | 2022<br>අප්‍රේල් අවසානයට (ආ) |
|---|---|---|---|
| මුළු සක්‍රිය කාඩ්පත් ගණන | 1,927,195 | 1,965,396 | 1,973,481 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 15,861 | 15,487 | 15,314 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,911,334 | 1,949,909 | 1,958,167 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 133,285 | 138,819 | 138,192 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 38,719 | 41,407 | 40,427 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 94,565 | 97,413 | 97,765 |


(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික


## 2.8 වාණිජ පත්‍රිකා නිකුතු (අ)

| අයිතමය (රු. බිලියන) | 2021<br>දෙසැ. අවසානයට | 2022<br>මාර්තු අවසානයට | 2022<br>අප්‍රේල් අවසානයට (ආ) |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) (ඇ) | 5.8 | 0.4 | 0.5 |
| නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට) | 1.1 | 0.9 | 0.9 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව

(ආ) තාවකාලික (ඇ) වසරේ මේ දක්වා එකතුව




## 2.9 කොටස් වෙළඳපොළ


| අයිතමය | 2022 ජූනි 17<br>වැනි දිනට | 2022 ජූනි 10<br>වැනි දිනට | වසරකට පෙර |
|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය<br>(1985 = 100) (ASPI) | 7,472.39 | 7,898.79 | 7,715.46 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය<br>(2004 = 1,000) (S&P SL20) | 2,368.65 | 2,560.57 | 3,083.38 |
| දෛනික පිරිවැටුම (සතිපතා සාමාන්‍යය) (රු. මිලියන) | 980.44 | 1,326.41 | 2,421.42 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 3,221.30 | 3,461.50 | 3,416.49 |
| විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන) | 44.51 | 28.60 | 37.49 |
| විදේශීය විකිණුම් (රු. මිලියන) | 61.79 | 23.75 | 99.75 |
| ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන) | (17.29) | 4.84 | (62.26) |

# රාජ්‍ය මූල්‍ය අංශය

## 3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

| ශීර්ෂය | 2021 පෙබරවාරි | 2022 පෙබරවාරි(අ) |
|---|---|---|
| **ආදායම් සහ ප්‍රදාන** | **238.3** | **311.5** |
| ආදායම | 238.2 | 311.5 |
| බදු ආදායම | 223.2 | 251.9 |
| බදු නොවන | 14.9 | 59.6 |
| ප්‍රදාන | 0.1 | 0.05 |
| **වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම්** | **466.0** | **551.7** |
| පුනරාවර්තන | 421.1 | 487.6 |
| ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණය දීම් | 44.8 | 64.2 |

(අ) තාවකාලික





## 3.2 මධ්‍යම රජයේ නොපිය වූ ණය (රු. බිලියන) (අ)

| ශීර්ෂය | 2021 වසර අවසානයට | 2022 පෙබරවාරි අවසානයට(ආ) |
|---|---|---|
| සමස්ත දේශීය ණය | 11,097.2 | 11,479.0 |
| එයින් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 2,270.5 | 2,449.8 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 6,966.2 | 7,484.8 |
| රුපියල් ණය | 24.1 | 24.1 |
| සමස්ත විදේශීය ණය | 6,492.2 | 6,461.2 |
| **මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය** | **17,589.4** | **17,940.2** |

(අ) 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර , නේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත .

(ආ) තාවකාලික




මූලයන් : මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව

## 3.3 රාජ්‍ය සුරැකුම්පත් - ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික 2022 ජූනි 15 දිනෙන් අවසන් වූ සතියට


| සුරැකුම්පත | පරිණත කාලය | ප්‍රාථමික වෙළඳපොළ (අ) % | | ද්විතීයික වෙළඳපොළ (ආ) % | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මෙම සතිය | | | පසුගිය සතියේ සාමාන්‍යය |
| | | මෙම සතිය | පසුගිය සතිය | මිලට ගැනීමේ අනුපාතිකය | විකුණුම් අනුපාතිකය | සාමාන්‍යය | |
| භාණ්ඩාගාර බිල්පත් | දින 91 | 20.73 | 21.91 | 20.20 | 19.70 | 19.95 | 21.20 |
| | දින 182 | 21.90 | 22.89 | 21.12 | 20.31 | 20.71 | 21.88 |
| | දින 364 | 22.04 | 23.13 | 21.68 | 20.68 | 21.18 | 22.51 |
| භාණ්ඩාගාර බැඳුම්කර | < වසර 02 | - | - | 20.53 | 19.54 | 20.04 | 20.26 |
| | < වසර 03 | 20.30 | - | 20.29 | 19.48 | 19.89 | 20.16 |
| | < වසර 04 | - | - | 20.61 | 19.39 | 20.00 | 20.32 |
| | < වසර 05 | - | - | 20.26 | 19.47 | 19.87 | 20.38 |
| | < වසර 06 | - | - | 20.47 | 19.55 | 20.01 | 20.53 |
| | < වසර 08 | 20.19 | - | 20.60 | 19.69 | 20.14 | 20.46 |
| | < වසර 10 | - | - | 21.29 | 20.25 | 20.77 | 20.91 |
| | < වසර 15 | - | - | 22.26 | 20.41 | 21.34 | 21.42 |
| | < වසර 20 | - | - | 20.57 | 19.18 | 19.87 | 20.04 |
| | < වසර 30 | - | - | 21.00 | 20.33 | 20.66 | 20.66 |


(අ) 2022 ජූනි 15 දිනෙන් අවසන් වූ සතිය තුළ සිදු වූ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු

(ආ) ද්විතීයික වෙළඳපොළ තුළ ඉදිරිපත්කල ඵලදා අනුපාතිකයන්ගේ මධ්‍යන්‍ය

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය පහළට විතැන් වී ඇති අතර වසර 30 ට අඩු පරිණත කාල සහිත භාණ්ඩාගාර බැඳුම්කර හැර අනෙකුත් භාණ්ඩාගාර බැඳුම්කර වල ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රයද පහළට විතැන් වී ඇත.**

| සුරැකුම්පත | පරිණත දිනය | කූපන් අනුපාතිකය % | ද්විතීයික වෙළඳපොළ % | |
|---|---|---|---|---|
| | | | මෙම සතිය | පසුගිය සතිය |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 2022-ජූලි-25 | 5.88 | - | - |
| | 2023-අප්‍රේ-18 | 5.75 | - | - |
| | 2024-මාර්-14 | 6.85 | - | - |
| | 2024-ජුනි-28 | 6.35 | - | - |
| | 2025-ජුනි-03 | 6.13 | 42.36 | 39.85 |
| | 2025-නොවැ-03 | 6.85 | 40.10 | 37.87 |
| | 2026-ජූලි-18 | 6.83 | 36.30 | 34.33 |
| | 2027-මැයි-11 | 6.20 | 31.29 | 29.61 |
| | 2028-අප්‍රේ-18 | 6.75 | 29.06 | 27.60 |
| | 2029-මාර්-14 | 7.85 | 29.08 | 27.67 |
| | 2030-මාර්-28 | 7.55 | 26.44 | 25.18 |



## 3.4 රාජ්‍ය සුරැකුම්පත්- 2022 ජුනි 15 දිනෙන් අවසන් වූ සතියට ප්‍රාථමික හා ද්විතීයීක වෙළඳපොළ ගනුදෙනු සාරාංශය

| අයිතමය | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| නොපියවූ රාජ්‍ය ණය සුරැකුම්පත් | | |
| භාණ්ඩාගාර බිල්පත් | 2,967,455.63 | 2,927,757.04 |
| භාණ්ඩාගාර බැඳුම්කර (අ) | 8,063,451.46 | 8,003,451.46 |
| **එකතුව** | **11,030,907.09** | **10,931,208.50** |
| අනේවාසිකයින් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර | 2,870.89 | 2,816.43 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 512,819.36 | 529,686.80 |

**පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 1.93කින් ඉහළ ගොස් ඇත.**

| ප්‍රාථමික වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 98,000.00 | 98,000.00 |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 202,222.00 | 260,565.00 |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 98,000.00 | 98,000.00 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| ඉදිරිපත් කළ ප්‍රමාණය | 50,000.00 | - |
| ලැබුණු ලංසු ප්‍රමාණය | 168,674.00 | - |
| පිළිගත් ලංසු ප්‍රමාණය | 50,000.00 | - |

**මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 2.1 ගුණයක් වන අතර භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 3.4 ගුණයකි.**

| ද්විතීයීක වෙළඳපොළ ක්‍රියාකාරකම් | ප්‍රමාණය (රු. මිලියන) | |
|---|---|---|
| | මෙම සතිය | පසුගිය සතිය |
| භාණ්ඩාගාර බිල්පත් | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 141,795.74 | 133,822.78 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 348,995.81 | 404,955.00 |
| භාණ්ඩාගාර බැඳුම්කර | | |
| හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 173,961.64 | 149,104.25 |
| ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්) | 669,019.10 | 776,373.73 |

**පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයීක වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය 8.91ක ප්‍රතිශතයකින් අඩු වී ඇත.**

අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත නිකුත් කරන ලද, 2032.01.01 දින පරිණත වීමට නියමිත රු. මිලියන 31,445.60 ක භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් වේ.

## 3.5 ද්වි පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බිල්පත්) - 2022 ජුනි 17

| පරිණතියට ඇති ඉතිරි කාලය | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|
| 1-7 දින | 99.69 | 16.37 | 99.71 | 15.14 | 0.02 |
| මාස 1 | 98.56 | 17.48 | 98.66 | 16.25 | 0.10 |
| මාස 2 | 97.02 | 18.14 | 97.15 | 17.37 | 0.13 |
| මාස 3 | 95.03 | 20.15 | 95.14 | 19.72 | 0.11 |
| මාස 4 | 93.62 | 19.40 | 93.85 | 18.71 | 0.23 |
| මාස 5 | 92.05 | 19.33 | 92.24 | 18.88 | 0.18 |
| මාස 6 | 89.61 | 21.08 | 89.96 | 20.37 | 0.35 |
| මාස 7 | 88.63 | 19.77 | 88.88 | 19.33 | 0.25 |
| මාස 8 | 86.95 | 19.85 | 87.23 | 19.43 | 0.28 |
| මාස 9 | 85.25 | 19.94 | 85.56 | 19.53 | 0.31 |
| මාස 10 | 83.56 | 20.00 | 83.90 | 19.58 | 0.34 |
| මාස 11 | 81.76 | 20.18 | 82.14 | 19.75 | 0.38 |
| මාස 12 | 78.43 | 21.87 | 79.43 | 20.86 | 0.99 |


## 3.6 ද්වී පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බැඳුම්කර) - 2022 ජුනි 17

| භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය | පරිණත කාලය (වසර ගණන) | පරිණත දිනය (දිනය/මාසය /වර්ෂය ) | පරිණතියට ඇති දින ගණන | සාමාන්‍ය මිලට ගැනීමේ මිල | ඵලදා අනුපාතික % | සාමාන්‍ය විකුණුම් මිල | ඵලදා අනුපාතික % | ගැණුම් හා විකුණුම් මිල පරතරය |
|---|---|---|---|---|---|---|---|---|
| 11.20%2022A | 9 | 2022 ජූලි 1 | 14 | 99.62 | 20.01 | 99.66 | 19.16 | 0.03 |
| 10.00%2022A | 8 | 2022 ඔක්තෝබර් 1 | 106 | 97.06 | 20.33 | 97.43 | 18.98 | 0.37 |
| 05.75%2022A | 3 | 2022 නොවැම්බර් 15 | 151 | 94.63 | 19.81 | 94.92 | 18.99 | 0.30 |
| 07.90%2022A | 3 | 2022 දෙසැම්බර් 15 | 181 | 94.73 | 19.57 | 95.00 | 18.94 | 0.27 |
| 08.65%2023A | 3 | 2023 ජනවාරි 15 | 212 | 94.13 | 19.86 | 94.51 | 19.09 | 0.38 |
| 10.00%2023A | 6 | 2023 මාර්තු 15 | 271 | 93.32 | 20.00 | 93.80 | 19.24 | 0.48 |
| 11.50%2023A | 6 | 2023 මැයි 15 | 332 | 93.10 | 20.12 | 93.71 | 19.31 | 0.61 |
| 10.20%2023A | 5 | 2023 ජූලි 15 | 393 | 90.56 | 20.36 | 91.37 | 19.42 | 0.81 |
| 09.00%2023A | 10 | 2023 සැප්තැම්බර් 1 | 441 | 88.18 | 20.50 | 89.16 | 19.46 | 0.99 |
| 11.20%2023A | 9 | 2023 සැප්තැම්බර් 1 | 441 | 89.83 | 21.11 | 90.49 | 20.42 | 0.66 |
| 07.00%2023A | 20 | 2023 ඔක්තෝබර් 1 | 471 | 85.28 | 20.53 | 86.31 | 19.47 | 1.04 |
| 06.30%2023A | 3 | 2023 නොවැම්බර් 15 | 516 | 83.24 | 20.57 | 84.35 | 19.50 | 1.11 |
| 11.60%2023A | 5 | 2023 දෙසැම්බර් 15 | 546 | 88.35 | 21.09 | 89.18 | 20.36 | 0.83 |
| 11.40%2024A | 10 | 2024 ජනවාරි 1 | 563 | 88.36 | 20.59 | 89.32 | 19.77 | 0.96 |
| 10.90%2024A | 5 | 2024 මාර්තු 15 | 637 | 86.82 | 20.19 | 88.28 | 19.07 | 1.46 |
| 10.25%2024A | 5 | 2024 ජූනි 15 | 729 | 84.25 | 20.23 | 85.84 | 19.12 | 1.58 |
| 11.00%2024A | 8 | 2024 අගෝස්තු 1 | 776 | 84.34 | 20.42 | 85.93 | 19.36 | 1.59 |
| 09.85%2024A | 5 | 2024 සැප්තැම්බර් 15 | 821 | 81.94 | 20.22 | 83.77 | 19.04 | 1.83 |
| 06.00%2024A | 10 | 2024 දෙසැම්බර් 1 | 898 | 73.10 | 20.47 | 74.67 | 19.45 | 1.57 |
| 10.25%2025A | 10 | 2025 මාර්තු 15 | 1,002 | 78.94 | 20.65 | 80.32 | 19.86 | 1.38 |
| 09.00%2025A | 12 | 2025 මැයි 1 | 1,049 | 76.29 | 20.27 | 77.80 | 19.43 | 1.51 |
| 17.00%2025A | 3 | 2025 ජූනි 1 | 1,080 | 92.54 | 20.47 | 93.65 | 19.93 | 1.11 |
| 11.00%2025A | 10 | 2025 අගෝස්තු 1 | 1,141 | 79.23 | 20.27 | 80.98 | 19.38 | 1.75 |
| 10.35%2025A | 8 | 2025 ඔක්තෝබර් 15 | 1,216 | 76.83 | 20.23 | 78.35 | 19.47 | 1.51 |
| 06.75%2026A | 5 | 2026 ජනවාරි 15 | 1,308 | 66.44 | 20.41 | 68.32 | 19.44 | 1.88 |
| 09.00%2026A | 13 | 2026 පෙබරවාරි 1 | 1,325 | 71.67 | 20.42 | 73.66 | 19.45 | 1.99 |
| 05.35%2026A | 15 | 2026 මාර්තු 1 | 1,353 | 61.93 | 20.49 | 63.52 | 19.65 | 1.59 |
| 11.00%2026A | 11 | 2026 ජූනි 1 | 1,445 | 75.60 | 20.25 | 77.27 | 19.50 | 1.68 |
| 11.50%2026A | 10 | 2026 අගෝස්තු 1 | 1,506 | 76.11 | 20.31 | 77.54 | 19.69 | 1.42 |
| 11.40%2027A | 8 | 2027 ජනවාරි 15 | 1,673 | 74.30 | 20.26 | 76.12 | 19.51 | 1.82 |
| 18.00%2027A | 5 | 2027 මැයි 1 | 1,779 | 93.16 | 20.25 | 94.73 | 19.70 | 1.58 |
| 11.75%2027A | 10 | 2027 ජූනි 15 | 1,824 | 73.90 | 20.31 | 75.44 | 19.70 | 1.54 |
| 07.80%2027A | 7 | 2027 අගෝස්තු 15 | 1,885 | 60.52 | 20.55 | 63.04 | 19.45 | 2.52 |
| 10.30%2027A | 8 | 2027 ඔක්තෝබර් 15 | 1,946 | 68.21 | 20.32 | 70.03 | 19.59 | 1.83 |
| 11.25%2027A | 10 | 2027 දෙසැම්බර් 15 | 2,007 | 69.96 | 20.64 | 72.19 | 19.77 | 2.22 |
| 18.00%2028A | 6 | 2028 ජනවාරි 15 | 2,038 | 92.03 | 20.44 | 93.71 | 19.90 | 1.68 |
| 10.75%2028A | 10 | 2028 මාර්තු 15 | 2,098 | 67.41 | 20.68 | 69.64 | 19.82 | 2.22 |
| 09.00%2028B | 15 | 2028 මැයි 1 | 2,145 | 61.24 | 20.69 | 63.33 | 19.83 | 2.09 |
| 09.00%2028A | 15 | 2028 ජූලි 1 | 2,206 | 60.89 | 20.61 | 64.03 | 19.35 | 3.14 |
| 11.50%2028A | 13 | 2028 සැප්තැම්බර් 1 | 2,268 | 69.73 | 20.27 | 72.12 | 19.40 | 2.38 |
| 13.00%2029A | 15 | 2029 ජනවාරි 1 | 2,390 | 71.70 | 21.18 | 73.94 | 20.38 | 2.23 |
| 13.00%2029B | 15 | 2029 මැයි 1 | 2,510 | 73.18 | 20.41 | 75.70 | 19.56 | 2.52 |
| 11.00%2030A | 15 | 2030 මැයි 15 | 2,889 | 63.72 | 20.43 | 66.19 | 19.56 | 2.47 |
| 11.25%2031A | 12 | 2031 මාර්තු 15 | 3,193 | 60.83 | 21.28 | 63.14 | 20.45 | 2.31 |
| 12.00%2031A | 10 | 2031 දෙසැම්බර් 1 | 3,454 | 62.75 | 21.30 | 65.11 | 20.48 | 2.36 |
| 08.00%2032A | 20 | 2032 ජනවාරි 1 | 3,485 | 45.91 | 21.61 | 48.93 | 20.32 | 3.02 |
| 09.00%2032A | 20 | 2032 ඔක්තෝබර් 1 | 3,759 | 49.39 | 21.30 | 51.42 | 20.48 | 2.03 |
| 11.20%2033A | 15 | 2033 ජනවාරි 15 | 3,865 | 59.71 | 20.73 | 63.43 | 19.48 | 3.71 |
| 09.00%2033A | 20 | 2033 ජූනි 1 | 4,002 | 45.14 | 22.80 | 49.43 | 20.93 | 4.30 |
| 13.25%2033A | 20 | 2033 ජූලි 1 | 4,032 | 61.95 | 22.80 | 67.45 | 20.90 | 5.50 |
| 09.00%2033B | 20 | 2033 නොවැම්බර් 1 | 4,155 | 44.62 | 22.80 | 49.02 | 20.88 | 4.40 |
| 13.25%2034A | 20 | 2034 ජනවාරි 1 | 4,216 | 61.56 | 22.80 | 67.22 | 20.85 | 5.67 |
| 10.25%2034A | 15 | 2034 සැප්තැම්බර් 15 | 4,473 | 52.79 | 21.15 | 58.19 | 19.23 | 5.39 |
| 11.50%2035A | 20 | 2035 මාර්තු 15 | 4,654 | 53.52 | 22.80 | 58.81 | 20.80 | 5.28 |
| 10.50%2039A | 20 | 2039 අගෝස්තු 15 | 6,268 | 52.79 | 20.53 | 57.66 | 18.85 | 4.88 |
| 12.00%2041A | 25 | 2041 ජනවාරි 1 | 6,773 | 59.33 | 20.60 | 62.74 | 19.50 | 3.41 |
| 09.00%2043A | 30 | 2043 ජූනි 1 | 7,654 | 44.26 | 20.75 | 46.48 | 19.80 | 2.22 |
| 13.50%2044A | 30 | 2044 ජනවාරි 1 | 7,868 | 65.06 | 20.90 | 68.01 | 20.00 | 2.95 |
| 13.50%2044B | 30 | 2044 ජූනි 1 | 8,020 | 64.39 | 21.10 | 66.30 | 20.50 | 1.90 |
| 12.50%2045A | 30 | 2045 මාර්තු 1 | 8,293 | 59.17 | 21.25 | 59.88 | 21.00 | 0.72 |

# විදේශීය අංශය

## 4.1 විනිමය අනුපාතික [අ]

| අයිතමය | 2022 ජූනි 17 දිනෙන් අවසන් වූ සතිය | | | සාමාන්‍යය අනුපාතිකය | |
|---|---|---|---|---|---|
| (ඒකකයකට රුපියල්)[ආ] | ගැනුම් මිල | විකුණුම් මිල | සාමාන්‍යය අනුපාතිකය | සතියකට පෙර | වසරකට පෙර |
| එ.ජ. ඩොලර් | 355.51 | 366.33 | 360.92 | 361.07 | 200.46 |
| ස්ටර්ලිං පවුම් | 435.14 | 452.23 | 443.68 | 450.71 | 280.20 |
| ජපන් යෙන් | 2.64 | 2.75 | 2.70 | 2.69 | 1.81 |
| යූරෝ | 372.41 | 387.07 | 379.74 | 383.69 | 239.94 |
| ඉන්දියානු රුපියල් [ඇ] | | | 4.61 | 4.62 | 2.73 |
| විශේෂ ගැනුම් හිමිකම් ( 2022 ජූනි 16 දිනට ) | | | 478.37 | 484.73 | 287.54 |
| මහ බැංකුව විසින් සිදු කරන ලද මිලදී ගැනීම් සහ විකිණීම් [ඈ] (එ.ජ. ඩොලර් මිලියන ) | | | 2022 මැයි | මසකට පෙර | වසරකට පෙර |
| මිලදී ගැනීම් | | | 76.60 | 140.95 | 13.57 |
| විකිණීම් | | | 155.10 | 244.90 | 10.00 |




| අයිතමය | 2022 ජූනි 17 දිනෙන් අවසන් වූ සතිය | සතියකට පෙර | වසරකට පෙර |
|---|---|---|---|
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 10.73 | 8.76 | 34.76 |
| (වාණිජ බැංකු අතර සිදුවන එතැන්, පසුදින සහ එදින ගනුදෙනු) | | | |
| ඉදිරි විනිමය ගනුදෙනු | | | |
| ඉදිරි විනිමය අනුපාතික (රු/එ.ජ. ඩොලර්) [ඉ] | | | |
| මාස 1 | - | 361.10 | 198.35 |
| මාස 3 | - | - | 197.36 |
| සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) | 6.96 | 6.44 | 27.84 |
| නොපියවූ ඉදිරි විනිමය ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) ( 2022 ජූනි 16 දිනට ) | 173.73 | 176.18 | 1,020.09 |

(අ) මහ බැංකුව විසින් 2022 වසරේ මැයි මස 13වැනි දින සිට අන්තර් බැංකු බර තැබූ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකයෙහි මධ්‍යය අනුපාතිකය සහ විචලන සීමාව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කළේය.

(ආ) වාණිජ බැංකුවල සාමාන්‍ය මධ්‍යස්ථ අනුපාතිකය (පෙ.ව. 9.30 ට පවතින)

(ඇ) මහ බැංකුවේ දෛනික මධ්‍යය විනිමය අනුපාතිකය

(ඈ) මාසය තුළ මහ බැංකුව විසින්, වාණිජ බැංකු වෙතින් වෙළඳපොළ මිලට සිදු කරනු ලබන සමස්ත විකිණීම් සහ මිලදී ගැනීම්

(ඉ) සැබෑ ගනුදෙනු මත පදනම් වූ සතියේ සාමාන්‍යය


## 4.2 සංචාරක සේවා සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ


| අයිතමය | | 2021 මැයි | 2022[අ] මැයි | 2021 ජන.-මැයි | 2022[අ] ජන.-මැයි | % වෙනස |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් | සංඛ්‍යාව | 1,497 | 30,207 | 15,294 | 378,521 | 2,375.0 |
| සංචාරක ඉපැයීම් | (එ.ජ. ඩොලර් මිලියන) | 3.9 [ආ] | 54.3 | 39.9[ආ] | 680.7 | 1,607.8 |
| | (රුපියල් බිලියන) | 0.8 [ආ] | 19.5 | 7.8 [ආ] | 169.5 | 2,069.8 |

| | | 2021 මැයි | 2022[අ] මැයි | 2021 ජන-මැයි | 2022[අ] ජන-මැයි | % වෙනස |
|---|---|---|---|---|---|---|
| විදේශ සේවා නියුක්තිකයන්ගේ | (එ.ජ. ඩොලර් මිලියන) | 460.1 | 304.1 | 2,845.9 | 1,335.6 | (53.1) |
| ප්‍රේෂණ ලැබීම් | (රුපියල් බිලියන) | 91.8 | 109.2 | 556.0 | 363.7 | (34.6) |

(අ) තාවකාලික

(ආ) 2021 වසරේ දී සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය දින ගණන සහ දිනක් සඳහා වන වියදම පිළිබඳ සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන සමීක්ෂණයේ ප්‍රතිඵල මත සංශෝධනය වී ඇත.



## 4.3 2022 මැයි මස අවසානයට නිල සංචිත වත්කම් (අ)

| | |
|---|---|
| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) (ආ) | **1,920** |
| (1) විදේශ මුදල් සංචිත | 1,805 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 65 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 21 |
| (4) රත්‍රන් | 28 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1 |

(අ) තාවකාලික

(ආ) එ.ජ. ඩොලර් බිලියන 1.5කට පමණ සමාන වූ චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් අන්තර්ගත වන අතර , එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

## 4.4 2022 අප්‍රේල් මස අවසානයට විදේශ සංචිත සහ විදේශ මුදල් ද්‍රවශීලතාවය (අ)

| නිල සංචිත වත්කම් (එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---|
| නිල සංචිත වත්කම් (ආ) | **1,812** |
| (1) විදේශ මුදල් සංචිත | 1,602 |
| (අ) සුරැකුම්පත් | 31 |
| (ආ) මුළු මුදල් සහ තැන්පතු | 1,571 |
| (i) වෙනත් මහ බැංකු, පියවීම් සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ජා.මූ.අරමුදල සමඟ | 1,546 |
| (ii) විදේශයන්හි පිහිටි වාර්තා කරන රට තුළ මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ | 1 |
| (iii) වාර්තා කරන රටෙන් පිටත මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ | 24 |
| (2) ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම | 64 |
| (3) විශේෂ ගැනුම් හිමිකම් | 115 |
| (4) රත්‍රන් | 29 |
| (5) අනෙකුත් සංචිත වත්කම් | 1 |

විදේශ සංචිත මගින් ඉදිරියේදී සිදුකළ යුතු කෙටිකාලීන ශුද්ධ ගෙවීම් (ඇ) (එ.ජ. ඩොලර් මිලියන)

| අයිතමය | එකතුව | කල්පිරීම | | |
|---|---|---|---|---|
| | | මාසයක් ඇතුලත | මාස 1 ට වැඩි සහ මාස 3 දක්වා | මාස 3 ට වැඩි සහ වසරක් දක්වා |
| 1. විදේශ ණය, සුරැකුම්පත් සහ තැන්පතු (ඈ) | (3,677) | (456) | (267) | (2,954) |
| ගෙවීම් (–) ණය වාරික ආපසු ගෙවීම | (3,417) | (408) | (235) | (2,774) |
| පොලිය | (260) | (48) | (31) | (180) |
| ලැබීම් (+) ණය වාරික ආපසු ලැබීම | | | | |
| පොලිය | | | | |
| 2. විදේශ මුදලින් සහ දේශීය මුදලින් පවතින ඉදිරි ගිවිසුම් සහ අනාගත සුරැකුම්වල සමස්ත හිඟ සහ අතිරික්ත තත්ත්වය (විනිමය හුවමාරු ගිවිසුම්වල ඉදිරි ගනුදෙනු ද (forward leg) අන්තර්ගතව) | (1,976) | 5 | (295) | (1,686) |
| (i) හිඟ (–)(ඉ) | (2,364) | (65) | (425) | (1,874) |
| (ii) අතිරික්ත (+) | 388 | 70 | 130 | 188 |
| 3. අනෙකුත් | (16) | (16) | | |
| ප්‍රතිවිකිණුම් හා සම්බන්ධ ලැබීම් (+) | | | | |
| ප්‍රතිමිලදී ගැනීම් හා සම්බන්ධ ගෙවිම් (-) | | | | |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (–) | (16) | (16) | | |

(අ) තාවකාලික

(ආ) එ.ජ. ඩොලර් බිලියන 1.5කට පමණ සමාන වූ චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් අන්තර්ගත වන අතර , එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

(ඇ) මෙහි ඉදිරියේ දී සිදුකළ යුතු ගෙවීම් ප්‍රධාන වශයෙන් අන්තර්ගත වේ .


(ඈ) තෝරාගත් විදේශීය ණය සේවාකරණයන් තාවකාලිකව අත්හිටුවන බවට රජය විසින් නිවේදනය කිරීමෙන් පසුව , පුරෝකථනය කරන ලද කෙටි කාලීන ශුද්ධ ගෙවීම් පමණක් ඇතුළත් වේ.


(ඉ) ඉදිරි විනිමය හුවමාරු ගිවිසුම්වල වැඩි කොටසක් නොපියවා ඉදිරියට ගෙනයනු ලැබේ .


## 4.5 විදේශීය වෙළඳාම


| අයිතමය | එ.ජ. ඩොලර් මිලියන | | | රුපියල් මිලියන | | |
|---|---|---|---|---|---|---|
| | 2021 ජන.- අප්‍රේල් | 2022 ජන.- අප්‍රේල් (අ) | % වෙනස | 2021 ජන.- අප්‍රේල් | 2022 ජන.- අප්‍රේල් (අ) | % වෙනස |
| **අපනයන** | **3,800.3** | **4,219.1** | **11.0** | **740,107.0** | **1,022,139.5** | **38.1** |
| කෘෂිකාර්මික | 829.4 | 783.5 | (5.5) | 161,551.9 | 189,698.4 | 17.4 |
| කාර්මික | 2,949.4 | 3,416.9 | 15.8 | 574,354.9 | 828,110.4 | 44.2 |
| ආහාර, පාන හා දුම්කොළ | 167.4 | 179.8 | 7.4 | 32,609.7 | 43,604.2 | 33.7 |
| රෙදිපිළි හා ඇඟලුම් | 1,699.5 | 1,924.6 | 13.2 | 330,893.7 | 465,930.4 | 40.8 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 122.1 | 238.0 | 94.9 | 23,781.7 | 57,888.6 | 143.4 |
| සම් භාණ්ඩ හා රබර් නිෂ්පාදිත | 332.8 | 344.4 | 3.5 | 64,792.8 | 83,131.3 | 28.3 |
| වෙනත් | 627.6 | 730.1 | 16.3 | 122,277.0 | 177,555.9 | 45.2 |
| ඛනිජ අපනයන | 16.0 | 12.3 | (22.8) | 3,114.8 | 2,821.3 | (9.4) |
| වෙනත් අපනයන | 5.6 | 6.4 | 14.3 | 1,085.5 | 1,509.5 | 39.1 |
| **ආනයන** | **6,748.1** | **7,350.2** | **8.9** | **1,315,235.8** | **1,780,597.9** | **35.4** |
| පාරිභෝගික භාණ්ඩ | 1,276.5 | 1,176.6 | (7.8) | 248,526.7 | 280,259.3 | 12.8 |
| අන්තර් භාණ්ඩ | 4,065.7 | 4,806.6 | 18.2 | 792,655.9 | 1,173,868.2 | 48.1 |
| ආයෝජන භාණ්ඩ | 1,403.1 | 1,365.2 | (2.7) | 273,513.8 | 326,034.8 | 19.2 |
| වෙනත් | 2.8 | 1.8 | (34.6) | 539.5 | 435.6 | (19.2) |
| **වෙළඳ ශේෂය** | **(2,947.8)** | **(3,131.1)** | **-** | **(575,128.7)** | **(758,458.4)** | **-** |


(අ) තාවකාලික





## 4.6 වෙළඳ දර්ශක (2010= 100 ) (අ)

| අයිතමය | 2022 අප්‍රේල් (ආ) | පෙර මාසය (ආ) | පෙර වසර |
|---|---|---|---|
| මුළු අපනයන | | | |
| වටිනාකම | 135.0 | 147.1 | 113.9 |
| ප්‍රමාණය | 162.1 | 165.2 | 152.7 |
| ඒකක වටිනාකම | 83.3 | 89.1 | 74.6 |
| මුළු ආනයන | | | |
| වටිනාකම | 152.1 | 162.8 | 152.8 |
| ප්‍රමාණය | 141.7 | 158.3 | 177.2 |
| ඒකක වටිනාකම | 107.3 | 102.8 | 86.2 |
| වෙළෙඳ මිල අනුපාතය | 77.6 | 86.6 | 86.5 |

(අ) එ.ජ. ඩොලර්වලින් අගය කරන ලද (ආ) තාවකාලික

## 4.7 වෙළඳ භාණ්ඩ මිල ගණන්

| අයිතමය | 2021 අප්‍රේල් | 2022 (අ) අප්‍රේල් | % වෙනස | 2021 අප්‍රේල් | 2022 (අ) අප්‍රේල් | % වෙනස |
|---|---|---|---|---|---|---|
| කොළඹ තේ වෙන්දේසිය | කි.ග්‍රෑම් 1 ක් එ.ජ. ඩො. | | | කි.ග්‍රෑම් 1 ක් රුපියල් | | |
| තේ මිල | 3.19 | 4.25 | 33.4 | 628.91 | 1,357.74 | 115.9 |
| ආනයන (මි.ර.ගා.) | මෙට්‍රික් ටොන් 1 ක් එ.ජ. ඩො. | | | මෙට්‍රික් ටොන් 1 ක් රුපියල් | | |
| සහල් | 885.45 | 422.04 | (52.3) | 174,808.99 | 134,818.07 | (22.9) |
| සීනි | 492.69 | 575.22 | 16.8 | 97,267.79 | 183,749.99 | 88.9 |
| තිරිඟු | 288.22 | 380.61 | 32.1 | 56,902.13 | 121,581.74 | 113.7 |
| | බැරලයක් එ.ජ. ඩො. | | | බැරලයක් රුපියල් | | |
| බොරතෙල් (ආ) | 66.44 | - | - | 13,116.57 | - | - |

(අ) තාවකාලික

(ආ) 2022 වසරේ අප්‍රේල් මාසයේ දී බොරතෙල් ආනයනය කර නැත.